# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වජිර අබේවර්ධන ශ්‍රවණාගාරය සඳහා අය කරනු ලබන ගාස්තු

01) ආපසු ගෙවනු ලබන මූලික තැන්පතුව

| | |
|---|---|
| අ) අමාත්‍යාංශය, රජයේ දෙපාර්තමේන්තු , සංස්ථා සහ මණ්ඩල සඳහා | රු.5500 |
| ආ) පෞද්ගලික ආයතන සඳහා | රු.9000 |

02) වෙන් කරනු ලබන කාල සීමාව සඳහා ගාස්තු ( අවම කාල සීමාව පැය 02 කි. )

| | |
|---|---|
| අ) අමාත්‍යාංශය, රජයේ දෙපාර්තමේන්තු , සංස්ථා සහ මණ්ඩල සඳහා | රු.4000 |
| ආ) පෞද්ගලික ආයතන සඳහා | රු.5000 |

(මෙම ගාස්තුවට පොල් තෙල් පහණ සහ මයික්‍රෆෝන් සමඟ පොදු ඇමතුම් පහසුකම් ඇතුළත් වේ.)

03) අතිරේක උපකරණ සහ පහසුකම්.

| | |
|---|---|
| 01. මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය | රු.5000.00 |
| 02. ප්‍රක්ෂේපන තිරය (7’×7’) | රු. 800.00 |
| 03. ශ්‍රවනාගාර වැඩසටහනක් වීඩියෝ පටිගත කිරීම සඳහා විදුලිබල ගාස්තු සඳහා | රු.1500.00 |
| 04. රූපවාහිණී වැඩසටහනක් වීඩියෝ පටිගත කිරීම සඳහා විදුලිබල ගාස්තු සඳහා | රු.2500.00 |

මෙහි සඳහන් අතිරේක උපකරණ ශ්‍රවණාගාරය වෙන් කරන්නන් විසින් ගෙන එනු ලබන්නේ නම්, ඒ සඳහා නියමිත උපකරණ ගාස්තුවෙන් 25% ක මුදලක් අය කරනු ලැබේ.


සියළු විමසීම්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන - 0719633497/0112889490
Fax: 0112889491
Email:rgd@sltnet.lk

# <u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වජිර අබේවර්ධන ශ්‍රවණාගාරය</u>

වායු සමනය කරන ලද මෙම ශ්‍රවනාගාරය ආසන 200 කින් සහ පහත සඳහන් නවීන පහසුකම් වලින් සමන්විත වේ.

- කථිකාසනය සමග පොදු ඇමතුම් පහසුකම්
- ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක

මෙම ශ්‍රවණාගාරය අධ්‍යාපනික සහ වෙනත් සම්මන්ත්‍රණ, රැස්වීම්,වැඩමුළු යනාදිය සඳහා විශේෂයෙන් සුදුසුවේ.

**<u>කොන්දේසි සහ නීතිරීති</u>**

01. සෑම අයදුම් කරුවෙකුම ශ්‍රවණාගාරය වෙන් කරවා ගැනීමට පෙර තම ආයතනය සහ පැවැත්වීමට බලාපොරොත්තුවන වැඩසටහන පිළිබඳ විස්තර ඇතුළත් විධිමත් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.
02. ශ්‍රවණාගාරයට, එහි උපකරණ, භාණ්ඩ හෝ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වෙනත් දේපළ වලට යම් හානියක් සිදු වුවහොත් එහි වටිනාකම ඉහත කී තැන්පතුවෙන් අය කරනු ලබන අතර අලාභය තැන්පතුවේ වටිනාකම ඉක්මවන්නේ නම් එම මුදලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට බැඳී සිටී.
03. වෙන් කර ගන්නා ලද කාලය ඉක්මවා ගියහොත් (02) ඡේදය යටතේ ඒ සඳහා අතිරේක ගාස්තු ගෙවිය යුතුය.
04. වැඩසටහන පැවැත්වීමෙන් අනතුරුව ඇප තැන්පත් මුදල හෝ ඉතිරි මුදල ආපසු ලබාගැනීම සඳහා මුදල් ගෙවූ රිසිට්පත් සමඟ ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.
05. ශ්‍රවණාගාරය වෙන් කරන්නන් විසින් ගෙන එනු ලබන භාණ්ඩයන්හි වගකීම තමන් විසින් දැරිය යුතුය.ඒ සඳහා රෙ. ජ. දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.
06. ශ්‍රවණාගාරය වෙන්කර ගන්නා අවස්ථාවේදීම ආපසු ගෙවනු ලබන තැන්පතුව ගෙවිය යුතු අතර වැඩසටහන පැවැත්වෙන දිනට යටත් පිරිසෙන් රාජකාරි දින 14කට පෙර සම්පූර්ණ ගාස්තු ගෙවා නිම කළ යුතුය.එසේ නොගෙවුවහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ශ්‍රවණාගාරය වෙන් කිරීම අවලංගු කරනු ලැබේ.
07. ශ්‍රවණාගාරය වෙන් කර ගැනීමෙන් අනතුරුව වැඩසටහන පැවැත්වෙන දිනට රාජකාරි දින 07කට පෙර ඉහත කී පරිදි දැනුම් දීමකින් තොරව ශ්‍රවණාගාරය වෙන් කර ගැනීම අවලංගු කරන්නේ නම් තැන්පත් මුදල හා ශ්‍රවණාගාර ගාස්තු යන දෙකෙහිම එකතුවෙන් 50% ක මුදලක් රඳවා ගෙන ඉතිරි මුදල ආපසු ගෙවනු ලැබේ.
08. ශ්‍රවණාගාරය තුල සිසිල් බීම, තේ පානය හෝ ආහාර අනුභව කිරීමට අවසර නොදෙන අතර ආහාර සැපයීමද නොකළ යුතුය.
    කලින් අවසරය ලබාගෙන ශ්‍රවණාගාරයෙන් පිටතදී එම අවශ්‍යතා සපුරා ගත හැකිය.
09. ශ්‍රවණාගාර වෙන් කර ගත් පසු අදාළ වැඩසටහනෙහි පිටපතක් වැඩසටහන පැවැත්වෙන දිනට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.
10. වැඩසටහනට සහභාගි වන්නන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රාජකාරි වලට බාධා නොවන අයුරින් හැසිරවීමට සංවිධායකයින් වගබලා ගත යුතුය.
11. ශ්‍රවණාගාරය වෙන් කර ගන්නන් ශ්‍රවණාගාරයට, එහි උපකරණ හා භාණ්ඩ ආදියට කිසිදු හානියක් නොවන අයුරින් කටයුතු කිරීමට වගබලා ගත යුතුය.


**සියළු විමසීම්**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

දුරකථන - 0719633497/0112889490

Fax: 0112889491

Email:rgd@sltnet.lk

12. අදාළ වැඩසටහන සඳහා සම්භාවනීය විශේෂ අමුත්තන් සහභාගී කරගන්නේ නම් ඔවුනගේ ආරක්ෂාව පිළිබඳ වගකීම සංවිධායකයින් වගබලා ගත යුතුය.
13. සම්භාවනීය අමුත්තන්ගේ රථ වාහන සීමිත සංඛ්‍යාවක් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නවතා තැබීමට අවසර දෙනු ලැබේ.එසේ නවතා තැබීමට අවශ්‍ය රථ වාහන වල අංක ශ්‍රවණාගාරය වෙන් කරන්නන් විසින් වැඩසටහන ආරම්භ වීමට පෙර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

**සියළු විමසීම්**
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
දුරකථන - 0719633497/0112889490
Fax: 0112889491
Email:rgd@sltnet.lk